- මුහුම් ක්‍රම ශිල්පවල ප්‍රවේණික මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරයි.
- ස්වාභාවික හා කෘත්‍රිම අභිජනන ක්‍රමවල වාසි හා අවාසි සංසන්දනය කරයි
- වැඩිදියුණු කළ ප්‍රභේදන ලබා ගැනීම සඳහා ශාක හා සත්ත්ව අභිජනන ශිල්පීය ක්‍රමවල වටිනාකම අගය කරයි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

- සුදුසු උදාහරණ සඳහන් කරමින් ශාක හා සත්ත්ව අභිජනනයේ වැදගත්කම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මිනිසාගේ අවශ්‍යතා සඳහා යොදා ගෙන තිබෙන සමහර ශාක හා සත්ත්ව අභිඅජනන ක්‍රම සුදුසු පින්තූර/ වීඩියෝ/ ග්‍රන්ථ ඇසුරෙන් විස්තර කරන්න.
- අභිජනන ක්‍රමවල ප්‍රවේණික මූලධර්ම විස්තර කරන්න.
- ලිපි/කියවීම් ද්‍රව්‍ය සිසුනට ලබා දී ස්වභාවික හා කෘත්‍රිම අභිජනන ක්‍රම සංසන්දනය කර, වාසි හා අවාසි වගුගත කිරීමට සහය වන්න.
- ශාක හා සත්ත්ව අභිජනන ක්‍රම හා ඒවා මගින් වර්තමානයේ දී වැඩිදියුණු කරන ලද ප්‍රභේද ලබා ගන්නා ආකාරය (කිරි ගවයන්ගෙන් වැඩි කිරි පරිමාවක් ලබාගැනීම, ඉහළ පිෂ්ඨ ඵලදාවක් සහිත බෝග ආදිය) පිළිබඳ ඉදිරිපත් කිරීමට සිසුන්ව මෙහෙයවන්න.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පහත දෙන ලද නිර්ණායක භාවිතයෙන් සිසුන් අගයන්න.
    - සොයාගැනීම්වල නිරවද්‍යතා
    - තොරතුරුවල අදාළත්වය
    - ඉදිරිපත් කිරීමේ කුසලතා
    - කාල කළමනාකරණය



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 07 ඒකකය - අණුක ජීව විද්‍යාව හා ප්‍රතිසංයෝජිත DNA තාක්ෂණය

නිපුණතාව 7.1.0 : ප්‍රවේණික ද්‍රව්‍යවල අණුක පදනම විමර්ශනය කරයි

නිපුණතා මට්ටම 7.1.1: ප්‍රවේණික ද්‍රව්‍යයේ ව්‍යුහය හා කෘත්‍යය පරීක්ෂා කරයි.

කාලච්ඡේද : 06 යි

ඉගෙනුම් ඵල :

- DNA හා RNAහි මූලික ව්‍යුහය මතක් කරයි.
- DNAහි ගුණ පැහැදිලි කරයි.
- වර්ණදේහවල ව්‍යුහික නිර්මාණය විස්තර කරයි.
- ප්‍රාග්න්‍යෂ්ටික වර්ණදේහ සුන්‍යෂ්ටික වර්ණදේහයෙන් වෙන් කොට දක්වයි
- DNA ප්‍රතිවලිතයේ වැදගත්කම පැහැදිලි කරයි.
- DNA ප්‍රතිවලිතය සඳහා භාවිත වන එන්සයිම නම් කර, ඒවායේ වැදගත්කම ප්‍රකාශ කරයි
- DNA ප්‍රතිවලිත වීමේ දී සිදු වන වැරදි ප්‍රමාණය ඉතා අවම බව ප්‍රකාශ කරයි
- DNA ප්‍රතිවලිත වීමේ මූලික ලක්ෂණ පැහැදිලි කරයි
- ප්‍රාග්න්‍යෂ්ටික හා සුන්‍යෂ්ටික DNA ප්‍රතිවලිත වීමේ වෙනස්කම් දක්වයි
- DNA ප්‍රතිසංස්කරණය සහ එහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරයි
- සෛලයක ප්‍රවේණික අණුව ලෙස DNAහි ලාක්ෂණික ලක්ෂණ පැහැදිලි කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:

- DNA හා RNA අණුවල මූලික ව්‍යුහය පිළිබඳ බුද්ධි කලම්භන සැසියක් මෙහෙයවන්න.
- DNA අණුවේ ගුණ සඳහන් කිරීමට සිසුන්ව මෙහෙයවන්න.
- වර්ණදේහවල ව්‍යුහික නිර්මාණය විස්තර කිරීම සඳහා විදහා දැක්වීමක් ගොඩනැංවීමට සිසුන්ව යොමු කරන්න.
- ප්‍රාග්න්‍යෂ්ටික හා සුන්‍යෂ්ටික වර්ණදේහ වල වෙනස්කම් වගුගත කිරීමට සිසුන්ට සහාය වන්න.
- DNA ප්‍රතිවලිත වීමේ මූලික ලක්ෂණ (ද්විත්ව හෙලික්සය දිග හැරීම, නියුක්ලියෝටයිඩ බහුඅවයවීකරණය, RNA මූලිකවල කාර්යභාරය, පෙරටු හා ප්‍රමාදී දාමය, හිඳැස් මුද්‍රා තැබීම, එන්සයිමවල කාර්යභාරය - DNA හෙලිකේස, ප්‍රයිමේස, DNA පොලිමරේස, DNA ලයිගේස) පෙන්නුම් කිරීම සඳහා සුදුසු රූප සටහන් වීඩියෝ හෝ ආකෘති යොදා ගනිමින් ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න. එය කණ්ඩායමක් වශයෙන් ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දෙන්න.
- ප්‍රාග්න්‍යෂ්ටික DNA ප්‍රතිවලිත වීම සුන්‍යෂ්ටික DNA ප්‍රතිවලිත වීමෙන් වෙනස් වන ආකාරය විස්තර කිරීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- DNA ප්‍රතිවලිත වීමේ වැදගත්කම ගවේෂණය කර ලැයිස්තුගත කිරීමට සිසුන්ට ඉඩ ලබා දෙන්න.
- සෛලය තුළ DNA අණුව ප්‍රවේණික අණුව ලෙස ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරන්න.
- සිසුන් කණ්ඩායමක් ලෙස DNA අලුත්වැඩියා කිරීමේ යාන්ත්‍රණය හා එහි වැදගත්කම යන මැයින් පෝස්ටරයක් නිර්මාණයට සිසුන්ට සහාය වන්න.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පහත සඳහන් නිර්ණායක යොදා ගනිමින් සිසුන්ගේ ඉදිරිපත් කිරීම් අගයන්න.
    - විෂය කරුණුවල නිරවද්‍යතාව
    - අදාළත්වය හා සුදුසු ආධාරක යොදා ගැනීම
    - කණ්ඩායම් ක්‍රියාකාරකම්
    - කාල කළමනාකරණය

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතා මට්ටම 7.1.2: ජාන හා ඒවා ක්‍රියා කරන ආකාරය පරීක්ෂා කරයි

කාලච්ඡේද : 09 යි

ඉගෙනුම් ඵල :

- ප්‍රාග්න්‍යෂ්ටික හා සුන්‍යෂ්ටික ජීනෝමයේ මූලික ව්‍යුහය හා සංවිධානය සහ ඒවායේ වෙනස කෙටියෙන් පැහැදිලි කරයි.
- ජාන හා වර්ණදේහ අතර සම්බන්ධතාව දක්වයි.
- ප්‍රවේණික කේතයේ ලක්ෂණ පැහැදිලි කරයි.
- එක්සෝන සහ ඉන්ට්‍රෝන කෙටියෙන් පැහැදිලි කරයි.
- ප්‍රෝටීන සංස්ලේෂණයට අදාළ DNA, RNA හා එන්සයිමවල කාර්යභාරය ප්‍රකාශ කරයි.
- ප්‍රෝටීන සංශ්ලේෂණයේ ප්‍රධාන පියවර ලෙස ප්‍රතිලේඛන හා පරිවර්තනය නම් කරයි.
- ඒකජාන - ඒක පොලිපෙප්ටයිඩ කල්පිතය ප්‍රකාශ කරයි.
- ප්‍රතිලේඛන හා පරිවර්තන ක්‍රියාවලිවල මූලික පියවර ලැයිස්තුගත කරයි.
- වර්ණදේහවාදයේ වටිනාකම අගය කරයි.
- ජීවිතයට අණුක ජීව විද්‍යාවේ වැදගත්කම අගයයි.
- සෛලය තුළ ප්‍රෝටීනවල ඉරණම හා හායනය අගය කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:

- ප්‍රාග්න්‍යෂ්ටික හා සුන්‍යෂ්ටික ජීනෝමයේ මූලික ව්‍යුහය හා සංවිධානය විස්තර කරන්න.
- ප්‍රාග්න්‍යෂ්ටික හා සුන්‍යෂ්ටික ජීනෝමවල වෙනස්කම් ලැයිස්තුගත කිරීමට සිසුන් මෙහෙයවන්න.
- ජාන වර්ණදේහ සමඟ ඇති සම්බන්ධ පිළිබඳ බුද්ධි කලම්බන සැසියක් පවත්වන්න.
- 'ප්‍රවේණි කේතය' හා 'කෝඩෝනය ' යන පද හඳුන්වා දෙන්න.
- වර්ණදේහයේ එක්සෝන, ඉන්ට්‍රෝන හා ජාන ප්‍රකාශ නොකරන ප්‍රදේශ පෙන්නුම් කිරීම සඳහා පෝස්ටරයක් නිර්මාණය කිරීමට සිසුන්ට සහාය වන්න.
- ජාන ප්‍රකාශනයේ ප්‍රධාන සිදුවීම් ලෙස 'ප්‍රතිලේඛන' හා 'පරිවර්තන' හඳුන්වා දෙන්න.
- ''ප්‍රතිලේඛනයේ' හා 'පරිවර්තනයේ' ප්‍රධාන පියවර විස්තර කිරීම සඳහා ඉදිරිපත් කිරීමක් කිරීමට සිසුන් මෙහෙයවන්න.
- ඒක ජාන - ඒක පොලිපෙප්ටයිඩ කල්පිතය හඳුන්වා දෙන්න.
- සෛලය තුළ ප්‍රෝටීනවල ඉරණම හා හායනය කෙටියෙන් පැහැදිලි කරන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් පහත සඳහන් නිර්ණායක යොදා ගනිමින් අගයන්න.
    - තොරතුරුවල නිරවද්‍යතාව හා අදාළත්වය
    - ක්‍රියාකාරි සහභාගිත්වය
    - කාල කළමනාකරණය

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිපුණතා මට්ටම 7.1.3: විකෘතිවල අණුක පදනම විභාග කරයි**

**කාලච්ඡේද : 06 යි**

**ඉගෙනුම් ඵල :**

- විකෘති යන පදය අර්ථ දක්වයි.
- විකෘතිවලට හේතු වන සාධක ලෙස විකෘතිකාරක ප්‍රකාශ කරයි.
- විකෘති වර්ග හා ඒවාට උදාහරණ ප්‍රකාශ කරයි.
- දෙන ලද ප්‍රවේණික ආබාධ සඳහා වර්ණදේහ තත්ත්ව පැහැදිලි කරයි. (ඩවුන් සහලක්ෂණය, ටර්නර් සහලක්ෂණය, වර්ණ අන්ධතාව, දෑකැති සෛල රක්තහීනතාව).
- සමහර මානව ප්‍රවේණි ගැටලු වැළකීමෙහි ලා ප්‍රවේණික උපදේශනයේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- පරිණාමයේ දී විකෘතිවල වැදගත්කම විස්තර කරයි.
- පරිණාමයේ දී විකෘතිවල දායකත්වය අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

- විකෘති හා විකෘති කාරක පිළිබඳ අර්ථ දැක්වීමක් ගොඩනැංවීමට සිසුන්ට සහාය වන්න.
- විකෘතිවල ප්‍රධාන ආකාර දෙක ලෙස ජාන හා වර්ණදේහ විකෘති ලෙස සිසුන්ට හඳුන්වා දෙන්න.
- සුදුසු උදාහරණ යොදා ගනිමින් ඒ ආකාර දෙක සැසැඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පහත දැක්වෙන ප්‍රවේණික ආබාධවලට අදාළ වර්ණදේහ තත්ත්ව සැසැඳීමට සිසුන්ට සහාය වන්න.
    - ඩවුන් සහලක්ෂණය
    - ටර්නර් සහලක්ෂණය
    - ක්ලයින්ෆෙල්ටර් සහලක්ෂණය
    - වර්ණ අන්ධතාවය
    - දෑකැති සෛල රක්තහීනතාව
- පරිණාමයේ දී විකෘතිවල වැදගත්කම ගවේෂණයට සිසුන් මෙහෙයවන්න.
- සමහර මානව ප්‍රවේණික ගැටලු වැළකීමෙහි ලා ප්‍රවේණික උපදේශනයේ වැදගත්කම පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට හා වාර්තාවක් සැකසීමට සිසුන්ට සහාය වන්න.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සමහර මානව ප්‍රවේණික ගැටලු වැළකීමෙහි ලා ප්‍රවේණික උපදේශනයේ වැදගත්කම' මැයෙන් සකසන ලද වාර්තාව පහත නිර්ණායක උපයෝගි කර ගනිමින් අගයන්න.
    - සන්ධාරයේ නිරවද්‍යතාව
    - සන්ධාරයේ අදාළත්වය
    - සන්ධාරයේ ප්‍රමාණත්වය
    - ආශ්‍රිත



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිපුණතාව 7.2.0 : ජාන තාක්ෂණය පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගනියි.**

**නිපුණතා මට්ටම 7.2.1: ජාන තාක්ෂණික ක්‍රමවේද හා ශිල්ප ක්‍රම පිළිබඳ යාවත්කාලීන වේ.**

**කාලච්ඡේද** : 08 යි

**ඉගෙනුම් ඵල :**

- DNA නිස්සාරණයේ ප්‍රධාන පියවර කෙටියෙන් සාකච්ඡා කරයි.
- ජාන තාක්ෂණයෙහි ලා එන්සයිමවල කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරයි.
- ඇගරෝස් ජෙල් විද්‍යුතාගමනයේ මූලධර්ම ප්‍රකාශ කරයි.
- න්‍යෂ්ටික අම්ල දෙමුහුම් කිරීමේ මූලධර්මය පැහැදිලි කරයි.
- DNA ඒෂණවල භාවිත ප්‍රකාශ කරයි.
- DNA ප්‍රතිසංයෝජන තාක්ෂණය යනු කුමක් දැයි ප්‍රකාශ කරයි.
- DNA ප්‍රතිසංයෝජන තාක්ෂණයේ දී භාවිත වන විවිධාකාර වාහක නම් කරයි.
- බැක්ටීරියා ප්ලාස්මිඩ, භක්ෂක සහ යීස්ට් (කෘත්‍රිම) වාහක ලෙස භාවිත කිරීමේ වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරයි.
- ජාන/ DNA ඛණ්ඩ ක්ලෝන කිරීමට අදාළ ප්‍රධාන පියවර දළ සැලැස්මකින් දක්වයි.
- සලකුණු ජාන හා DNA පුස්තකාලවල වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරයි.
- ප්‍රතිසංයෝජිත DNA තාක්ෂණයේ දී ප්‍රතිවර්තන ට්‍රාන්ස්ක්‍රිප්ටේස්වල කාර්යභාරය ප්‍රකාශ කරයි.
- කැමති ජාන කොටසක් ඇතුළු කිරීම සඳහා පරිණාමනය, පාරනයනය, *Agrobacterium* සහ ජාන තුවක්කු යොදා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරයි.
- DNA ප්‍රතිසංයෝජිත තාක්ෂණයේ සංකීර්ණතාව අගයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

- DNA නිස්සාරණයේ අදාළ වීඩියෝ/පෝස්ටර/ රූපසටහන්/ ඡායාරූප පෙන්වා, DNA නිස්සාරණයේ ප්‍රධාන පියවර ලැයිස්තුගත කිරීමට සිසුන්ට පවසන්න.
- DNA නිස්සාරණයේ මූලධර්ම, නියුක්ලියේසවල කාර්යභාරය, ලයිගේස, පොලිමරේස, DNA ඒෂණ, ඇගරොස් ජෙල් විද්‍යුතාගමනය සහ දෙමුහුම් කිරීමේ තාක්ෂණ සුදුසු රූපසටහන්/ ඡායාරූප/ වීඩියෝ යොදා ගනිමින් හඳුන්වා දෙන්න.
- ප්‍රතිසංයෝජිත DNA තාක්ෂණය යනු කුමක් දැයි හඳුන්වා දෙන්න.
- ජාන ක්ලෝණකරණය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- DNA තාක්ෂණයේ දී යොදා ගන්නා පහත සඳහන් විවිධ වාහක වර්ග හා ඒවායේ වැදගත්කම ප්‍රකාශ කරමින් පෝස්ටරයක් නිර්මාණය කිරීමට සිසුන් මෙහෙයවන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- බැක්ටීරියා ප්ලාස්මිඩ
- භක්ෂක
- යීස්ට් (කෘත්‍රිම)

- ප්‍රතිසංයෝජිත DNA තාක්ෂණයේ දී වාහක, DNA පුස්තකාල, ප්‍රතිවර්ත්‍යය ට්‍රාන්ස්ක්‍රිප්ටේස් හා සළකුණු ජානවල කාර්යභාරය වගුගත කිරීමට සිසුන්ව මෙහෙයවන්න.
- ජාන/ DNA ඛණ්ඩ ක්ලෝරණකරණයේ ප්‍රධාන පියවර ලැයිස්තුගත කිරීමට සිසුන්ට සහාය වන්න.
- පහත සඳහන් ජාන ඇතුළත් කිරීමේ පද්ධති හා ක්‍රම පිළිබඳ තොරතුරු එක් රැස් කිරීමට හා වාර්තාවක් සැකසීමට සිසුන් මෙහෙයවන්න.
  - පරිණාමනය
  - පාරනයනය
  - *Agrobacterium* මත පැවරීම
  - ජාන තුවක්කු

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සිසුන්ගේ වාර්තාව පහත නිර්ණායක මත අගයන්න.
  - තොරතුරුවල අදාළත්වය හා නිරවද්‍යතාවය
  - තොරතුරුවල ප්‍රමාණවත්භාවය
  - උදාහරණ
  - ආශ්‍රිත



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිපුණතා මට්ටම 7.2.2:** DNA විශ්ලේෂණය පිළිබඳ යාවත්කාලීන වේ.

**කාලච්ඡේද** : 07 යි

**ඉගෙනුම් ඵල :**

- නිරෝධ සිතියම්, DNA අනුක්‍රම, DNA ඇඟිලි සලකුණු, පොලිමරේස දාම ප්‍රතික්‍රියාව යනු කුමක් දැයි ප්‍රකාශ කරයි.
- නිරෝධ සිතියම්, DNA අනුක්‍රම, DNA ඇඟිලි සලකුණු, පොලිමරේස දාම ප්‍රතික්‍රියාවේ වැදගත්කම පිළිබඳ දළ සැකැස්මක් සකසයි.
- DNA විශ්ලේෂණයේ ත්වරක ක්‍රියාවලි ලෙස PCR චක්‍රය අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

- DNA විශ්ලේෂණයේ දී යොදා ගන්නා පහත සඳහන් තාක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් සිසුන්ට ලබා දෙන්න.
  - නිරෝධ සිතියම්
  - DNA අනුක්‍රම
  - DNA ඇඟිලි සලකුණු
  - පොලිමරේස දාම ප්‍රතික්‍රියාව (PCR)
- ඉහත සඳහන් DNA විශ්ලේෂණ තාක්ෂණවල වැදගත්කම පිළිබඳ තොරතුරු ගවේෂණයට සිසුන්ට සහාය වන්න. ඒ සොයාගැනීම් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දෙන්න.
- නිරෝධ සිතියම්, DNA අනුක්‍රම, DNA ඇඟිලි සලකුණු, පොලිමරේස දාම ප්‍රතික්‍රියාව පිළිබඳ සාරාංශය සකස් කිරීමට හා එහි වැදගත්කම ලැයිස්තුගත කිරීමට සිසුන්ට පවසන්න.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- DNA විශ්ලේෂණයට අදාළ තාක්ෂණ පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් මඟින් සිසුන් අගයන්න.

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිපුණතා මට්ටම 7.2.3 : ජාන තාක්ෂණයේ භාවිත පිළිබඳ යාවත්කාලීන වෙයි.**

**කාලච්ඡේද : 04 යි**

**ඉගෙනුම් ඵල :**

- ජාන විකරණයකළ ජීවීන් යනු කවුරුන් දැයි ප්‍රකාශ කරයි.
- වෛද්‍ය විද්‍යාවේ දී, කෘෂිකර්මාන්තයේ දී හා කර්මාන්තවල දී ජාන විකරණය කරන ලද ජීවීන්ගේ භාවිත සඳහා උදාහරණ සපයයි.
- ප්‍රවේණිකව විකරණය කරන ලද ජීවීන් භාවිතය නිසා ඇති වන පාරිසරික, සමාජ, ආර්ථික ගැටලු සොයා බලයි.
- කාටජිනා ගිවිසුම හා ජාතික ජෛව සුරක්ෂතා ගිවිසුම කෙටියෙන් විස්තර කරයි.
- අන්තර්ජාතික ගිවිසුම හා ජාතික ජෛව සුරක්ෂතා ගිවිසුම මිනිස් වර්ගයාගේ පැවැත්මට ඇති වැදගත්කම අගය කරයි.
- කුතුහලය දනවන හා මතභේදවලට තුඩුදෙන ක්ෂේත්‍රයක් ලෙස ජාන තාක්ෂණය අගය කරයි.
- විවිධ කේෂ්ත්‍ර වල ජාන තාක්ෂණයේ යෙදීම් අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

- වෛද්‍ය විද්‍යාවේ, කෘෂිකර්මාන්තයේ හා කර්මාන්තවල දී යොදා ගන්නා සුදුසු උදාහරණ භාවිතයෙන් 'ප්‍රවේනිකව විකරණය කරන ලද ජීවීන්'' හඳුන්වා දෙන්න.
- 'ප්‍රවේණිකව විකරණය' කරන ලද ජීවීන් පිළිබඳ සුදුසු අර්ථ දැක්වීමක් ගොඩනැංවීමට සිසුන්ට සහාය වන්න.
- ප්‍රවේණිකව විකරණය කරන ලද ජීවීන් නිසා ඇතිවන පාරිසරික හා සමාජ, ආර්ථික ගැටලු පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට සිසුන්ට පවරන්න. ඒ තොරතුරු කණ්ඩායමක් වශයෙන් ඉදිරිපත් කිරීමට සිසුන්ට ඉඩ ලබා දෙන්න.
- වෛද්‍ය විද්‍යාවේ දී, කෘෂිකර්මාන්තයේ දී සහ කර්මාන්තවල දී ප්‍රවේණිකව විකරණය කරන ලද ජීවීන්ගේ භාවිත පිළිබඳ උදාහරණ දැක්වෙන පෝස්ටරයක් නිර්මාණය කිරීමට සිසුන්ට පවසන්න.
- කාටජිනා ගිවිසුමේ හා ජාතික ජෛව සුරක්ෂතා ගිවිසුමේ අරමුණු හා වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පහත සඳහන් නිර්ණායක උපයෝගි කර ගනිමින් සිසුන්ගේ පෝස්ටරය අගයන්න.
    - තොරතුරුවල නිරවද්‍යතාව
    - තොරතුරුවල අදාළත්වය
    - තොරතුරුවල ප්‍රමාණවත් බව
    - දත්තවල සංවිධානය



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 08 ඒකකය - පාරිසරික ජීව විද්‍යාව

**නිපුණතාව 8.1.0 :** ජීවීන් හා පරිසරය අතර අන්තර් සම්බන්ධතා පිළිබඳ ජීව විද්‍යාත්මක විශ්ලේෂණයක යෙදෙයි.

**නිපුණතා මට්ටම 8.1.1:** පරිසර පද්ධතියක සංඝටක විමර්ශනය කරයි.

**කාලච්ඡේද :** 02 යි

**ඉගෙනුම් ඵල :**

- පරිසර ජීව විද්‍යාව යනු කුමක් දැයි ප්‍රකාශ කරයි
- පරිසර ජීව විද්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- පරිසරයේ ජීව සංවිධාන මට්ටම් අර්ථ දක්වයි.
- ප්‍රධාන ජෛව හා අජෛව සංඝටක ලැයිස්තුගත කරයි.
- පරිසරයේ විවිධ සංවිධාන මට්ටම් තිබීම අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

- පරිසර ජීව විද්‍යාව සඳහා අර්ථ දැක්වීමක් ගොඩනැංවීමට සිසුන්ට සහාය වන්න.
- පරිසර ජීව විද්‍යාව අධ්‍යයනයේ වැදගත්කම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඒකෛකයා සිට ජෛවගෝලය දක්වා පරිසරයේ ඇති සංවිධාන මට්ටම් දැක්වීමට ගැලීම් සටහනක් සැකසීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පරිසරයේ ඇති එක් එක් සංවිධාන මට්ටම් අර්ථ දක්වා, ඒවාට අදාළ උදාහරණ ලබා දෙන්න.
- ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කර, පරිසරයේ ඇති ජෛව හා අජෛව සංඝටක ලැයිස්තුගත කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න. පරිසරයේ ඇති එම ජෛව හා අජෛව සංඝටකවල වැදගත්කම ඉදිරිපත් කිරීමට සිසුන්ට පවසන්න.

www.alevelapi.com

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සිසුන්ගේ ගැලීම් සටහන පහත නිර්ණායක භාවිතයෙන් අගයන්න.
    - නිරවද්‍යතාව
    - නිවැරදි ගලා යෑම



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතා මට්ටම 8.1.2: පරිසර පද්ධතියක ප්‍රධාන ක්‍රියාවලි අන්වේෂණය කරයි.

කාලච්ඡේද : 03 යි

ඉගෙනුම් ඵල :
- නිකේතනය හා වාසස්ථාන යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරයි.
- ජීව හා අජීව සංඝටක අතර සම්බන්ධතා හඳුනා ගනියි.
- දෙන ලද පරිසර පද්ධතිවල ආහාර දාම හා ආහාර ජාල ගොඩනංවයි.
- ආහාර දාමයක් ඔස්සේ ශක්තිය හානි වන ආකාරය විස්තර කරයි.
- පරිසර පද්ධතිය තුළ ද්‍රව්‍ය හා ශක්තිය ගලා යන ආකාරය පිළිබඳ ගැලීම් සටහනක් අඳියි.
- පිරමීඩ වර්ග පැහැදිලි කරයි.
- පරිසර පද්ධතියක ජෛව හා අජෛව සංඝටක අතර අන්තර්ක්‍රියා අගය කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- පාසල් වත්තට ක්ෂේත්‍ර චාරිකාවක් සූදානම් කරන්න.
  - පරිසරයේ හමු වන විවිධ අන්තර්ක්‍රියා සෙවීමට සිසුන්ට මඟ පෙන්වන්න.
  - පරිසරයේ ඇති ජිව හා අජීව සංඝටක අතර ඇති සම්බන්ධතා හඳුනා ගැනීමට සිසුන්ට මඟ පෙන්වන්න.
  - පරිසර පද්ධතියේ සිටින ජීවීන් අතර ඇති ආහාර පුරුදු නිරීක්ෂණයට සිසුන්ට මඟ පෙන්වන්න.
  - ඔවුන්ගේ නිරීක්ෂණවලින් ආහාර ජාලයක් ගොඩනැගීමට උපදෙස් දෙන්න.
  - එම ආහාර ජාලය තුළ විවිධ ආහාර දාම ඉස්මතු කිරීමට පවසන්න.
  - අවසානයේ පරිසර පද්ධතිය තුළ ද්‍රව්‍ය හා ශක්තිය ගලන ආකාරය පිළිබඳ ඉස්මතු කිරීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සුදුසු උදාහරණ භාවිතයෙන් විවිධ ආහාර පිරමීඩ වර්ග හඳුන්වා දෙන්න.
- සුදුසු උදාහරණ භාවිතයෙන් නිකේතන හා වාසස්ථාන සංකල්පය හඳුන්වා දෙන්න.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්
- සිසුන්ගේ ආහාර ජාලය පහත නිර්ණායක යොදා ගනිමින් අගයන්න.
  - නිරවද්‍යතාව
  - අදාළත්වය
  - ප්‍රමාණවත් බව

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතාව 8.2.0 : ගෝලීය හා දේශීය ජීව පරිසර සංඝටකවල විෂමජාතීය ස්වභාවය ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 8.2.1: ලෝකයේ ප්‍රධාන බියෝම පිළිබඳ අන්වේෂණය කරයි.

කාලච්ඡේද : 06 යි

ඉගෙනුම් ඵල :
- බියෝමය අර්ථ දක්වයි.
- ලෝකයේ ප්‍රධාන භෞමික බියෝම ලැයිස්තුගත කරයි.
- ප්‍රධාන භෞමික බියෝමවල ව්‍යාප්තිය ලෝක සිතියමක ලකුණු කරයි.
- ප්‍රධාන ලාක්ෂණික ලක්ෂණ භාවිත කරමින් වෙනස් වර්ගවල බියෝම වෙන් කොට හඳුනා ගනියි (උෂ්ණත්වය, වර්ෂාපතනය, ශාක ලක්ෂණ, සත්ත්ව ලක්ෂණ සහ මිනිස් බලපෑම්).
- බියෝමවල විවිධත්වය අගය කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- බියෝමය සඳහා අර්ථ දැක්වීමක් ගොඩනැංවීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- ප්‍රධාන භෞමික බියෝම ලැයිස්තුගත කිරීමට සිසුන්ට සහයවන්න. (නිවර්තන වනාන්තර, සවානා, කාන්තාර, චපරාල්, සෞම්‍ය කලාපීය තෘණබිම්, පළල් පත්‍ර දරන වනාන්තර, උතුරු කේතුධර වනාන්තර, සහ තුන්ද්‍රා)
- ලෝක සිතියමක මේ බියෝම ව්‍යාප්තිය ලකුණු කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- දෙන ලද පින්තූර/ ලිපි/ වීඩියෝ භාවිතයෙන් එක් එක් බියෝමයේ ලක්ෂණ උපුටා ගැනීමට මඟ පෙන්වන්න. උපුටා ගන්නා ලද ලක්ෂණ යොදා ගනිමින්, ඒ බියෝම වෙන් කර ගැනීම සඳහා සිසුන්ට සහාය වන්න.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්
- සිසුන්ගේ සිතියම පහත නිර්ණායක යොදා ගනිමින් අගයන්න.
  - නිරවද්‍යතාව
  - පිළිවෙළ

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිපුණතා මට්ටම 8.2.2:** **ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති පිළිබඳ අන්වේෂණය කරයි**

**කාලච්ඡේද** : 12 යි

**ඉගෙනුම් ඵල :**
- ශ්‍රී ලංකාවේ වෙනස් වර්ගවල පරිසර පද්ධති ප්‍රකාශ කරයි.
- ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතිවල ලාක්ෂණික ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- එක් එක් පරිසර පද්ධතියේ පිහිටීම සිතියමක පෙන්නුම් කරයි.
- දෙන ලද පරිසර පද්ධතිවල ප්‍රමුඛ විශේෂ ප්‍රකාශ කරයි.
- ක්ෂේත්‍ර චාරිකාවකට පසු ශ්‍රී ලංකාවේ පවතින ඕනෑ ම පරිසර පද්ධතියක් පිළිබඳ කෙටි ඉදිරිපත් කිරීමක් කරයි.
- ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතිවල විවිධත්වය අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**
- ශ්‍රී ලංකාවේ ඇති පරිසර පද්ධති වර්ග ලැයිස්තුගත කිරීමට සිසුන්ට සහායවන්න. (පහතරට වැසි වනාන්තර, වියළි මෝසම් වනාන්තර, කඳුකර වනාන්තර, කටු කැලෑ, සවනා, පතන, ගංගා හා ඇළ දොළ, ජලාශ හා වැව්, වගුරු බිම් හා හැලි, විල්ලු, කලපු හා ගංමෝය, කඩොලාන, කොරල් පර, මුහුදු වෙරළ, වැලි කඳු, මුහුදු තෘණ පෙත්, හා ලවණ වගුරු).
- ශ්‍රී ලංකාවේ සිතියමක් ලබා දී , එක් එක් පරිසර පද්ධතියේ පිහිටීම ලකුණු කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- රූපසටහන්/ වීඩියෝ/ ක්ෂේත්‍ර චාරිකා මගින් එක් එක් පරිසර පද්ධතියේ ලාක්ෂණික ලක්ෂණ ලැයිස්තුගත කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- එක් එක් පරිසර පද්ධතියේ ප්‍රමුඛ විශේෂය හඳුනා ගැනීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිසර පද්ධති පිළිබඳ සිසු කණ්ඩායම්වලට ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට මඟ පෙන්වන්න.

www.alevelapi.com

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**
- සිසු කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම පහත නිර්ණායක භාවිතයෙන් අගයන්න.
  - නිරවද්‍යතාව
  - පිළිවෙළ



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතාව 8.3.0 : පරිසර සංඝටකයක් ලෙස ජෛව විවිධත්වය ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 8.3.1: මානව ක්‍රියාකාරකම්වලට අදාළව ජෛව විවිධත්වය හා තර්ජන ගවේෂණය කරයි.

කාලච්ඡේද : 07 යි

ඉගෙනුම් ඵල :
- ජෛව විවිධත්වය, පරිසර පද්ධති විවිධත්වය, විශේෂ විවිධත්වය සහ ප්‍රවේණි විවිධත්වය අර්ථ දක්වයි.
- ප්‍රධාන තේමාවන්ට අදාළ ජෛව විවිධත්වයේ වටිනාකම පැහැදිලි කරයි.
- ජෛව විවිධත්ව හායනය සිදු වන ප්‍රධාන මාර්ග පහක් ශ්‍රී ලාංකික උදාහරණ සහිතව ප්‍රකාශ කරයි.
- නෂ්ට වීම ස්වාභාවික ක්‍රියාවලියක් වන නමුත් මිනිස් ක්‍රියාකාරම් මගින් නෂ්ට වීමේ වේගය අධිකව වැඩි වන බව පැහැදිලි කරයි.
- රතු දත්ත ග්‍රන්ථයට අනුව තර්ජනයට ලක් වූ විශේෂ අර්ථ දක්වයි.
- ජෛව විවිධත්ව උණුසුම් කලාප අර්ථ දක්වයි.
- සුදුසු ශ්‍රී ලාංකික උදාහරණ ලබා දෙමින් දෙන ලද පද අර්ථ දැක්වීම් සිදු කරයි.
- ශ්‍රී ලංකාවේ අතිවිශාල ජෛව විවිධත්වය අගය කරමින්, එය ආරක්ෂා කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ගවල වැදගත්කම හඳුනා ගනියි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- ජෛව විවිධත්වය, පරිසර පද්ධති විවිධත්වය, විශේෂ විවිධත්වය හා ප්‍රවේණි විවිධත්වය යන පද සඳහා අර්ථ දැක්වීමක් ගොඩනැංවීමට සිසුන්ට සහාය වන්න.
- පහත තේමා යටතේ ජෛව විවිධත්වයෙන් වටිනාකම පිළිබඳ පොත් පිංචක් සැකසීමට සිසුන්ට මඟ පෙන්වන්න.
  - වාණිජමය හා වාණිජමය නොවන ද්‍රව්‍ය
  - පරිසරය
  - විනෝදය
  - ආචාර ධර්ම
  - සේවා
- ජෛව විවිධත්වය හායනය වන ආකාර පහක් ලෙස වාසස්ථාන අහිමි වීම හා කඩ කඩ වීම, අධිපරිභෝජනය, පරිසර දූෂණය, ආක්‍රමණික ආගන්තුක විශේෂ හඳුන්වාදීම හා දේශගුණික විපර්යාස ලෙස සුදුසු ශ්‍රී ලාංකික උදාහරණ භාවිතයෙන් ලියා දැක්වීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- නෂ්ට වීම ස්වාභාවික ක්‍රියාවලියක්වන නමුත් මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා එහි වේගයේ විශාල වැඩි වීමක් සිදු වී ඇති බව විස්තර කිරීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- රතු දත්ත පොතට අනුව පහත දැක්වෙන තර්ජනයට ලක් වූ විශේෂ අර්ථ දක්වන්න. ඒවාට අදාළ සත්ත්ව හා ශාක උදාහරණ ලබා දෙන්න.
    - අන්තරායට ලක් වීමට ඉඩ ඇති
    - අන්තරායට ලක් වූ
    - අතිශයින් අන්තරායට ලක් වූ
    - වනමය ලෙස නෂ්ට වූ
- ජෛව විවිධත්ව උණුසුම් කලාප සඳහා අර්ථ දැක්වීමක් ගොඩනැංවීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- පහත සඳහන් කාණ්ඩ සුදුසු උදාහරණ (ශ්‍රී ලාංකික) සමඟින් හඳුන්වා දෙන්න.
    - ඒක දේශීය විශේෂ
    - දේශීය විශේෂ
    - විදේශික විශේෂ
    - පර්යටන විශේෂ
    - අවශිෂ්ට විශේෂ
    - ධජයධාරි විශේෂ
    - මූලස්ථාන විශේෂ
    - ආක්‍රමණික විශේෂ

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- පොත් පිංච පහත සඳහන් නිර්ණායක යොදා ගනිමින් අගයන්න.
    - නිරවද්‍යතාව
    - අදාළත්වය
    - ප්‍රමාණවත් බව
    - ආශ්‍රිත

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතාව 8.4.0 : පරිසරයට අදාළ වූ ගෝලීය ගැටලු ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 8.4.1: ගෝලීය පාරිසරික ගැටලු පිළිබඳ යාවත්කාලීන වේ.

කාලච්ඡේද : 05 යි

ඉගෙනුම් ඵල :
- ප්‍රධාන ගෝලීය පාරිසරික ගැටලු ලැයිස්තුගත කරයි.
- ගෝලීය උණුසුම් වීම හා දේශගුණික විපර්යාස, ඕසෝන් වියන හායනය, අම්ල වැසි, කාන්තාරකරණය යන ඒවායේ අර්ථය ප්‍රකාශ කරයි
- ගෝලීය උණුසුම් වීම හා දේශගුණික විපර්යාසය, ඕසෝන් වියන හායනය, අම්ල වැසි, කාන්තාරකරණයට දායක වන සාධක පැහැදිලි කරයි
- ගෝලීය උණුසුම් වීම හා දේශගුණික විපර්යාසය, ඕසෝන් වියන හායනය, අම්ල වැසි, කාන්තාරකරණය යන ඒවායේ බලපෑම පැහැදිලි කරයි
- ගෝලීය පාරිසරික ගැටලු ඇති වීම කෙරෙහි මිනිස් බලපෑම් අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම පිළිගනියි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- ප්‍රධාන ගෝලීය පාරිසරික ගැටලු පිළිබඳ හඳුන්වා දීමට සාකච්ඡාවක් මෙහෙයවා, ප්‍රධාන ගෝලීය පාරිසරික ගැටලු ලැයිස්තුගත කිරීමට සිසුන්ට පවසන්න.
- පහත සඳහන් ප්‍රධාන පාරිසරික ගැටලු පිළිබඳ තොරතුරු පුවත්පත් සඟරා, අන්තර්ජාලය වැනි විවිධ ප්‍රභවවලින් සෙවීමට සිසුන්ට මඟ පෙන්වන්න.
  - ගෝලීය උණුසුම් වීම හා දේශගුණික විපර්යාස
  - ඕසෝන් වියන හායනය
  - කාන්තාරකරණය
  - අම්ල වැසි
- ඉහත ප්‍රධාන ගෝලීය ගැටලු, ඒවාට දායක වන සාධක, එහි බලපෑම හා ඒවා අවම කර ගන්නා ආකාරය පිළිබඳ මණ්ඩල සාකච්ඡාවක් (panel discussion) මෙහෙයවීමට උපදෙස් දෙන්න.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්
- සිසුන්ගේ මණ්ඩල සාකච්ඡාව පහත නිර්ණායක යොදා ගනිමින් අගයන්න.
  - තොරතුරුවල නිරවද්‍යතාව හා අදාළත්වය
  - තොරතුරුවල ප්‍රමාණවත් බව
  - ක්‍රියාකාරි සහභාගිත්වය
  - කාල කළමනාකරණය



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතාව 8.5.0 : පරිසර හා ජෛව විවිධත්ව සංරක්ෂණ පිළිබඳ ක්‍රම ගවේෂණය කරයි

නිපුණතා මට්ටම 8.5.1: ජෛව විවිධත්වය හා පරිසරය ගෝලීය හා ජාතික මට්ටමින් සංරක්ෂණය කරන ආකාරය අන්වේෂණය කරයි.

කාලච්ඡේද : 05 යි

ඉගෙනුම් ඵල :
- ස්ථානීය හා විතැන් සංරක්ෂණ ක්‍රම උදාහරණ සහිතව පැහැදිලි කරයි
- ගෝලීය ගිවිසුම්, ප්‍රධාන ජාතික නීති සම්පාදන සහ ඒවා පිළිබඳ පරිපාලනය පිළිබඳ දැනුම සහ අවබෝධය ආදර්ශනය කරයි.
- ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා අන්තර්ජාතික ගිවිසුම් සහ ජාතික නීති පැවතීමේ වැදගත්කම පිළිගනියි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- ස්ථානීය (*In -situ*) සහ විතැන් (*Ex-situ*) සංරක්ෂණ ක්‍රම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ස්ථානීය සහ විතැන් සංරක්ෂණ ක්‍රියාමාර්ග සඳහා නිදසුන් සෙවීමට සිසුන්ට මග පෙන්වන්න.
- පහත සඳහන් අන්තර්ජාතික ගිවිසුම් පිළිබඳ විවිධ ප්‍රභව මඟින් තොරතුරු එක්රැස්කර, බිත්ති පුවත්පතක් (Wall Paper) සකස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
  - CITES
  - ජෛව විවිධත්ව සම්මුතිය
  - Ramsar සම්මුතිය
  - Marpol සම්මුතිය
  - මොන්ට්‍රියල් ප්‍රඥප්තිය
  - කියෝතෝ සම්මුතිය
  - බාසල් සම්මුතිය
- පහත සඳහන් ජාතික පාරිසරික නීති මතු කර දක්වමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ශාක සහ සත්ත්ව ආරක්ෂක ආඥා පනත
  - ජාතික පරිසරික පනත

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්
- පහත සඳහන් නිර්ණායක භාවිත කර බිත්ති පුවත්පත අගයන්න.
  - තොරතුරුවල අදාළත්වය
  - නිරවද්‍යතාව
  - නිර්මාණශීලීත්වය



www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 09 ඒකකය - ක්‍ෂුද්‍රජීව විද්‍යාව

**නිපුණතාව9.1.0** : ක්ෂුද්‍රජීව විවිධත්වය හා ඔවුන් හැසිරවීම අන්වේෂණය කරයි.

**නිපුණතා මට්ටම 9.1.1**: ක්ෂුද්‍රජීවීන්ගේ විවිධත්වය හා ස්වභාවය පිළිබඳ ගවේෂණය කරයි.

**කාලච්ඡේද** : 10 යි

**ඉගෙනුම් ඵල :**

- ක්ෂුද්‍රජීවීන්ගේ ස්වභාවය කෙටියෙන් ප්‍රකාශ කරයි.
- ක්ෂුද්‍රජීවී වර්ග ප්‍රකාශ කරයි.
- ක්ෂුද්‍රජීවීන්ගේ රූපීය, පෝෂණ හා කායකර්මීය විවිධත්වය කෙටියෙන් පැහැදිලි කරයි. (බැක්ටීරියා, සයනොබැක්ටීරියා, ඒකසෛලීය ප්‍රෝටිස්ටාවන්, දිලීර, මොලිකියුට්ස්)
- වයිරසවල ලාක්ෂණික ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරයි.
- විවිධ වයිරස වර්ග ප්‍රකාශ කරයි.
- බැක්ටීරියා භක්ෂකයක ජීවනචක්‍රයේ පියවර පහ ප්‍රකාශ කරයි.
- රෝගකාරක ලෙස වයිරස, වයිරොයිඩ හා ප්‍රියෝන පැහැදිලි කරයි.
- ක්ෂුද්‍ර ජීව ලෝකයේ අතිවිශාල විවිධත්වය අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**:

- ක්ෂුද්‍රජීවීන්ගේ ස්වභාවය හා ආකාරය ලැයිස්තුගත කිරීමට සිසුන්ට සහාය වන්න.
- පොකුණු ජලය, දූෂිත ආහාර, දිරාපත් වන ද්‍රව්‍ය වැනි සාම්පල සිසුන් ලවා ගෙන්වා ඒ සාම්පල ආලෝක අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- ඉහත සඳහන් නිරීක්ෂණ පදනම් කර ක්‍ෂුද්‍රජීවීන්ගේ රූපීය විවිධත්වය ඉස්මතු කිරීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ප්‍රභාස්වයංපෝෂීන්, ප්‍රභාවිෂමපෝෂීන්, රසායනික ස්වයංපෝෂීන්, රසායනික විෂමපෝෂීන් යන ක්‍ෂුද්‍රජීවී පෝෂණ ක්‍රම සුදුසු උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.
- සුදුසු උදාහරණ භාවිත කරමින් ක්‍ෂුද්‍රජීවීන්ගේ කායික විද්‍යාත්මක විවිධත්වය සාකච්ඡා කරන්න.
- විවිධ ක්‍ෂුද්‍රජීවීන්ගේ නිදර්ශක/ සකස් කරන ලද කදා/ පින්තූර සිසුන්ට සපයා ක්‍ෂුද්‍රජීවීන්ගේ වර්ගීකරණ විවිධත්වය සාකච්ඡා කරන්න.
- රෝග කාරක ලෙස වයිරස, වයිරොයිඩ සහ ප්‍රියෝන පිළිබඳ සාකච්ඡා කරන්න.
- පින්තූර/ රූපසටහන්/ විඩියෝ දර්ශන භාවිත කරමින් බැක්ටීරියා භක්ෂකයක ජීවනචක්‍රය පැහැදිලි කරන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- පහත සඳහන් මාතෘකා යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට සිසු කණ්ඩායම්වලට පවරන්න.
  - ක්ෂුද්‍රජීවීන්ගේ රූපීය විවිධත්වය
  - ක්ෂුද්‍රජීවීන්ගේ පෝෂණ විවිධත්වය
  - කායික විද්‍යාත්මක විවිධත්වය

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සිසු කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම් පහත සඳහන් නිර්ණායකවලට අනුව අගයන්න.
  - ඉදිරිපත් කිරීමේ කුසලතාව
  - නිවැරදි තොරතුරු
  - කාල කළමනාකරණය
  - කණ්ඩායම් සහයෝගිතාව

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිපුණතා මට්ටම 9.1.2 :** **ක්ෂුද්‍රජීව විද්‍යාවේ මූලික විද්‍යාගාර ක්‍රමවේද ගවේෂණය කරයි**

**කාලච්ඡේද** : **06 යි**

**ඉගෙනුම් ඵල :**
- රෝපණ මාධ්‍ය (NA සහ PDA) සැකසීමේ කුසලතා වර්ධනය කර ගැනීම සහ ජීවාණුහරණ ක්‍රම සහ සරල වර්ණ ගැන්වීමේ ක්‍රම යොදා ගනියි.
- ක්ෂුද්‍රජීවීන් අධ්‍යයනය සහ එදිනෙදා ජීවිතයේ දී ඔවුන්ගේ භාවිතය පිළිබඳ ප්‍රීතිමත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

- ජීවාණුහරණය සහ එහි වැදගත්කම පිළිබඳ සාකච්ඡාවක් කිරීමට සිසුන් මෙහෙයවන්න.
- විවිධ භෞතික සහ රසායනික ජීවාණුහරණ ක්‍රම හා ඒවාට පාදක වන මූලධර්ම ගවේෂණය කිරීමට පවරන්න.
  - භෞතික - තෙත් තාපය, වියළි තාපය, පටල පෙරහන්, UV විකිරණ
  - රසායනික - විෂබීජ නාශක
- පහත දී ඇති වගුව සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න.

| ද්‍රව්‍ය/උපකරණ | ජීවාණුහරණ ක්‍රමය | අදාළ පරීක්ෂා තත්ත්ව |
|---|---|---|
| ජලය | | |
| PDA | | |
| තාප අස්ථායි මාධ්‍ය | | |
| ආමුතුලන කටු | | |
| සුළු සැත්කම් සඳහා භාවිත කරන සැත (Scalpal) | | |
| වීදුරු භාණ්ඩ | | |
| ප්ලාස්ටික් සිරින්ජර් | | |
| එළවළු/පලතුරු | | |

- පෝෂ්‍ය ඒගාර් සහ අර්තාපල් ඩෙක්ස්ට්‍රොස් වැනි රෝපණ මාධ්‍ය සෑදීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- ඉහත සඳහන් රෝපණ මාධ්‍ය ජීවාණුහරණයට සුදුසු ජීවාණුහරණ ක්‍රම භාවිත කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ක්ෂුද්‍ර ජීව සාම්පලවලින් (රා, යෝගට්. මූල ගැටිති) අදාළ රෝපණ මාධ්‍යය ආක්‍රමණය කරන්න.
- යෝගට්/ රාවල සිටින බැක්ටීරියා වර්ණ ගැන්වීමට සරල වර්ණ ගැන්වීමේ ක්‍රම යොදා ගැනීමට උපදෙස් දෙන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පහත සඳහන් නිර්ණායක භාවිත කරමින් සිසුන්ගේ සරල වර්ණගැන්වීමේ ක්‍රම අගයන්න.
    - උපකරණ නිසි ලෙස භාවිත කිරීම
    - නිවැරදි ක්‍රම භාවිත කිරීම
    - නිවැරදිව හඳුනා ගැනීම

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිපුණතාව 9.2.0 : මානව ආසාදන රෝගකාරක ලෙස ක්ෂුද්‍රජීවීන් පිළිබඳ අන්වේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 9.2.1 :** ආසාදන රෝගවලට අදාළ සංකල්ප හා මූලධර්ම පිළිබඳ ගවේෂණය කරයි

**කාලච්ඡේද :** 05 යි

**ඉගෙනුම් ඵල :**

- මිනිස් සිරුර තුළ සිටින සාමාන්‍ය ක්ෂුද්‍රජීව සමුදායේ ස්වභාවය, ව්‍යාප්තිය හා ඔවුන්ගේ කාර්යභාරය විස්තර කරයි.
- ආසාදන රෝගවලට අදාළ පද පැහැදිලි කරයි.
- ව්‍යාධිජනක ක්ෂුද්‍රජීවීන්ගේ වැදගත් ලාක්ෂණික ලක්ෂණ ප්‍රකාශ කරයි.
- ව්‍යාධිජනකතාවට අදාළ ප්‍රචණ්ඩතා සාධකවල වැදගත්කම පැහැදිලි කරයි
- ව්‍යාධිජනකතාව කෙරෙහි ධූලකජනකතාව හා ප්‍රචණ්ඩතා සාධකවල වැදගත්කම පැහැදිලි කරයි.
- අන්තඃධූලක හා බහිර්ධූලක අතර වෙනස පැහැදිලි කරයි.
- අනතඃධූලක හා බහිර්ධූලක නිපදවන ක්ෂුද්‍රජීවීන් සඳහා උදාහරණ ප්‍රකාශ කරයි
- ව්‍යාධිජනකයන් මිනිස් සිරුරට ඇතුළු වන ප්‍රවේශමාර්ග ප්‍රකාශ කරයි.
- ආසාදන රෝගයක් ඇති කිරීමෙහි ලා ව්‍යාධිජනක ක්ෂුද්‍රජීවීන්ගේ ස්වභාවය හඳුනා ගනියි.
- මිනිස් සම, ඇස, ස්නායු පද්ධතිය, හෘත් සනාල පද්ධතිය, ශ්වසන පද්ධතිය, ආහාර ජීරණ පද්ධතිය, ප්‍රජනක පද්ධතිය, මෛත්‍ර පද්ධතිය සහ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ආදියේ ඇති වන ප්‍රධාන ආසාදන රෝග ඒවායේ රෝග කාරක ද සමඟ ප්‍රකාශ කරයි.
- මිනිස් සම, ඇස, ස්නායු පද්ධතිය, හෘත් සනාල පද්ධතිය, ශ්වසන පද්ධතිය, ආහාර ජීරණ පද්ධතිය, ප්‍රජනක පද්ධතිය, මෛත්‍ර පද්ධතිය සහ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ආදියේ ඇති වන ප්‍රධාන ආසාදන රෝග වළක්වා ගන්නා ආකාර පැහැදිලි කරයි.
- රෝග සෑදීමෙහි ලා ක්ෂුද්‍රජීවීන්ගේ කාර්යභාරය වටහා ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

- මිනිස් දේහය තුළ සිටින සාමාන්‍ය ක්ෂුද්‍රජීවී සමුදායේ ස්වභාවය, පැතිරීම සහ කාර්යභාරය පැහැදිලි කිරීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ආසාදන රෝගවලට අදාළව පහත සඳහන් පද පැහැදිලි කිරීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ව්‍යාධිජනකයා
  - ව්‍යාධිජනකතාව
  - ධාරකයා
  - පරපෝෂිතයා
  - ධාරකයා හා පරපෝෂිතයා/ව්‍යාධිජනකයා අතර ඇති සම්බන්ධතාව



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .
www.alevelapi.com

- ප්‍රචණ්ඩතාව
- ධූලක
- ප්‍රවේශ මාර්ග

- පහත දී ඇති තොරතුරු ඇතුළත් වගුව ගොඩනැංවීමට ශිෂ්‍යයින්ට පවරන්න.

| ධූලකවල නම | බහිෂ්ධූලක/අන්තඃධූලක | උදාහරණ |
|---|---|---|
| සයිටොටොක්සීන් | | |
| එන්ටරොටොක්සීන් | | |
| නියුරොටොක්සින් | | |

- මිනිස් සිරුරේ පහත දී ඇති ස්ථානවල ඇති වන ප්‍රධාන ආසාදන රෝග සහ ඒ රෝග සඳහා හේතු වන රෝක කාරකයන් ඇතුළත් වගුවක් ගොඩනැංවීමට සිසුන්ට මග පෙන්වන්න.
  - මානව සම
  - ඇස්
  - ස්නායු පද්ධතිය
  - හෘත් සනාල පද්ධතිය
  - ශ්වසන පද්ධතිය
  - ආහාර ජීරණ පද්ධතිය
  - ප්‍රජනන පද්ධතිය
  - මෛත්‍ර පද්ධතිය
  - ප්‍රතිශක්තිකරණ පද්ධතිය

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පහත සඳහන් නිර්ණායක යටතේ සිසුන්ගේ වගුව අගයන්න.
  - විෂය කරුණුවල නිරවද්‍යතාව

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිපුණතා මට්ටම 9.2.2 : ක්ෂුද්‍රජීව ගහන පාලනය කිරීමේ ක්‍රම ගවේෂණය කරයි**

**කාලච්ඡේද** : 03 යි

**ඉගෙනුම් ඵල :**
- ක්ෂුද්‍රජීවීන් මගින් වැලඳෙන රෝග පාලනය කිරීමෙහි දී ව්‍යාසාධක හා ප්‍රතිපූතිකවල කාර්යභාරය පැහැදිලි කරයි.
- ව්‍යාසාධක හා ප්‍රතිපූතික වෙන් කර ප්‍රකාශ කරයි.
- ක්ෂුද්‍රජීව රෝග පාලනය සඳහා ප්‍රතිජීවකවල කාර්යභාරය ප්‍රකාශ කරයි.
- එන්නත් ආකාර සඳහන් කරයි.
- ක්ෂුද්‍රජීව ආසාදන රෝග මර්දනයේ දී එදිනෙදා ජීවිතයේ ස්වස්ථතා පුරුදුවල වැදගත්කම අගය කරයි.
- ආසාදන රෝග මර්දනය සඳහා කෘත්‍රිම ප්‍රතිශක්තිකරණ ක්‍රම අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**
- ප්‍රතිපූතික හා ව්‍යාසාදක සම්බන්ධ උපදෙස් සහිත ලේබල් සිසුන්ට ලබා දෙන්න.
- ප්‍රතිපූතික හා ව්‍යාසාධක වෙන් කර ගැනීමට සිසුන්ට සහාය වන්න.
- ක්ෂුද්‍රජීවීන් මගින් වැලඳෙන රෝග පාලනය හා සම්බන්ධව ව්‍යාසාදක, ප්‍රතිපූතික සහ ප්‍රතිජීවකවල කාර්යභාරය පිළිබඳව විවෘත සාකච්ඡාවක් මෙහෙයවන්න.
- බහුලව භාවිත වන එන්නත් හා රසායනික චිකිත්සකවල නම් ලබා දී ප්‍රතිශක්තිකරණය යන්න හඳුන්වා දෙන්න. ප්‍රතිශක්තිකරණ වර්ග (ස්වාභාවික සහ කෘත්‍රිම) පිළිබඳ අවධානය යොමු කරන්න.
- දේහය තුළ දී ක්‍රියාත්මක වන ප්‍රතිශක්තිකරණ ක්‍රම වර්ග පිළිබඳ සුදුසු උදාහරණ සහිතව වගුවක් ගොඩනැංවීමට සිසුන් යොමු කරන්න.

www.alevelapi.com

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**
- වගුවල ඇති තොරතුරුවල නිරවද්‍යතාව අගයන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතාව 9.3. 0 : කර්මාන්ත, කෘෂිකර්මය හා පරිසරය කළමනාකරණය සඳහා ක්ෂුද්‍ර ජීවීන් භාවිතය හා කෘෂිකර්මය සඳහා පාංශු ක්ෂුද්‍රජීවීන්ගේ ඇති දායකත්වය අන්වේෂණය කරයි.

නිපුණතා මට්ටම 9.3.1 : කර්මාන්ත, කෘෂිකර්මය හා පරිසරය කළමනාකරණය සඳහා ක්ෂුද්‍රජීවීන් යොදා ගැනීම පිළිබඳ අන්වේෂණය කරයි.

කාලච්ඡේද : 06 යි

ඉගෙනුම් ඵල :
- වාණිජ නිෂ්පාදන සඳහා ක්ෂුද්‍රජීවීන් භාවිත කිරීමේ වාසි විස්තර කරයි.
- ඵල සෑදීම සඳහා වැදගත් වන ක්ෂුද්‍රජීවීන්ගේ පරිවෘත්තීය ක්‍රියාවලි මූලධර්ම පැහැදිලි කරයි.
- විවිධ වාණිජ නිෂ්පාදනවල දී ක්ෂුද්‍රජීවීන්ගේ යෙදීම් ප්‍රකාශ කරයි.
- ක්ෂුද්‍රජීවීන් මගින් සිදු කෙරෙන විවිධ කර්මාන්තමය යෙදීම් ප්‍රකාශ කරයි.
- ක්ෂුද්‍රජීවීන්, ඔවුන්ගේ නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රියාවලිය මත පදනම් වූ කර්මාන්ත වෙන් කොට දක්වයි.
- පරිසර කළමනාකරණයේ දී ක්ෂුද්‍රජීවීන්ගේ භාවිත ප්‍රකාශ කරයි.
- කෘෂිකර්මාන්තයේ දී ක්ෂුද්‍රජීවීන්ගේ භාවිත ප්‍රකාශ කරයි.
- කර්මාන්ත සඳහා රසායනික ක්‍රියාවලිවලට වඩා ක්ෂුද්‍රජීවීන් යොදා ගැනීමේ වාසි අගය කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- ක්ෂුද්‍රජීවීන් පදනම් කර සිදු කරන කර්මාන්ත පිළිබඳ තොරතුරු රැස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඒ කර්මාන්ත ක්ෂුද්‍රජීවීන්, ක්ෂුද්‍රජීවී ඵල සහ ක්ෂුද්‍රජීවී ක්‍රියාවලි මත පදනම් වූ කර්මාන්ත ලෙස වෙන් කරන්න.
- ක්ෂුද්‍රජීවී පරිවෘත්තීය ක්‍රියාවලිවලට අදාළ මූලධර්ම ලැයිස්තුගත කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- වාණිජ ඵල නිෂ්පාදනයේ දී ක්ෂුද්‍රජීවීන් යොදාගැනීමේ වාසි ලැයිස්තුගත කිරීමට සිසුන්ට පවරන්න.
- පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ක්ෂුද්‍රජීවීන්ගේ වෙනත් යෙදීම් පිළිබඳ ලැයිස්තුගත කිරීමට සිසුන් යොමු කරන්න.
  - පාරිසරික කළමනාකරණය
  - කෘෂිකර්මාන්තය
- රසායනික ක්‍රියාවලිවලට වඩා ක්ෂුද්‍රජීවී ක්‍රියාවලිවල වාසි සහ අවාසි සන්සන්දනය කිරීමට සිසුන්ට පවරන්න.
- මිනිසාගේ පහසුව සඳහා ක්ෂුද්‍රජීවීන්ගේ භාවිත සඳහා සංකල්ප සිතියමක් සකස් කරන්න. (කර්මාන්ත, කෘෂිකර්මය හා පරිසර දූෂණය සඳහා ප්‍රතිකර්ම.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සිසුන් විසින් සකස් කරන ලද සංකල්ප සිතියම පහත සඳහන් නිර්ණායක භාවිත කර තක්සේරු කරන්න.
    - විෂය කරුණුවල නිරවද්‍යතාව
    - නිවැරදි අන්තර්-සම්බන්ධතාව
    - කාල කළමනාකරණය
    - සංකල්ප සටහනෙහි සංකීර්ණතාව

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතා මට්ටම 9.3.2 : පාංශු සෞඛ්‍යය පවත්වා ගැනීම සඳහා පාංශු ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරිත්වය ගවේෂණය කරයි.

කාලච්ඡේද : 06 යි

ඉගෙනුම් ඵල :
- ක්ෂුද්‍රජීවීන්ගේ වර්ධනය සඳහා පසේ රසායනික හා භෞතික පරිසරය සෞඛ්‍ය සම්පන්න මාධ්‍යයක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේ දැයි පැහැදිලි කරයි.
- පාංශු ක්ෂුද්‍රජීවීන්ගේ ස්වභාවය, ව්‍යාප්තිය හා කාර්යභාරය පැහැදිලි කරයි.
- ද්‍රව්‍ය චක්‍රීකරණයේ දී වියෝජකයන් වශයෙන් පාංශු ක්ෂුද්‍රජීවීන්ගේ කාර්යභාර්ය පැහැදිලි කරයි.
- නයිට්‍රජන්, කාබන් චක්‍රවල දී හා ඛනිජ භවනයේ දී ක්ෂුද්‍රජීවීන්ගේ සුවිශේෂ කාර්යභාර්ය විස්තාරණය කරයි.
- ශාක වර්ධනයට අදාළව පාංශු ක්ෂුද්‍රජීවීන්ගේ අන්තර්ක්‍රියා විස්තර කරයි.
- පාංශු ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමෙහි ලා ක්ෂුද්‍රජීවීන්ගේ කාර්යභාරය විස්තර කරයි.
- ක්ෂුද්‍රජීවීන් සතු වියෝජන කාර්යභාරය අගය කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- අහඹු ලෙස ලබා ගත් පස් සාම්පල NA සහ PDA මාධ්‍යයන්ට ආක්‍රමණය කර, එම නිරීක්ෂණ ආරම්භක පියවර ලෙස භාවිත කරමින්, ක්ෂුද්‍රජීවීන් සඳහා ඉතා සුදුසු මාධ්‍යයක් පස මගින් සපයන බව පැහැදිලි කරන්න.
- පසේ ඇති භෞතික සහ රසායනික පරිසරය පාංශු ක්ෂුද්‍රජීවීන් සඳහා ස්වාභාවික මාධ්‍යයක් සපයන බව සාකච්ඡා කරන්න.
- චක්‍රීයකරණ ක්‍රියාවලිය පැහැදිලි කිරීම සඳහා නයිට්‍රජන් චක්‍රය, කාබන් චක්‍රය සහ ඛනිජභවනය සහිත වගු භාවිත කරන්න.
- පාංශු ක්ෂුද්‍රජීවීන්ගේ කාර්යභාරය පිළිබඳ තොරතුරු එක් රැස් කර ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්
- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් පහත සඳහන් නිර්ණායක භාවිත කර අගයන්න.
  - තොරතුරුවල නිරවද්‍යතාව
  - අදාළත්වය
  - සුදුසු උදාහරණ

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතාව 9.4. 0 : ජලයේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ක්ෂුද්‍රජීව විද්‍යාත්මක සංකල්ප හා මූලධර්ම භාවිත කරයි.

නිපුණතා මට්ටම 9.4.1 : පානීය ජල සැපයුම හා අපජලය කළමනාකරණය සඳහා ක්ෂුද්‍රජීව විද්‍යාත්මක සංකල්ප හා මූලධර්ම භාවිත කරයි

කාලච්ඡේද : 06 යි

ඉගෙනුම් ඵල :

- පානීය ජලය දූෂණය විය හැකි මාර්ග පැහැදිලි කරයි.
- මලද්‍රව්‍යවලින් ජලය දූෂණය වීම හඳුනා ගැනීමට දර්ශකයක් ලෙස කෝලිෆෝම් බැක්ටීරියාවේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- ජලය මගින් සම්ප්‍රේෂණය කරනු ලබන රෝග ලැයිස්තුගත කරයි.
- නාගරික පානීය ජලය පිරිපහදු පිරියතක ජලය පිරියම් කිරීමේ පියවර කෙටියෙන් ප්‍රකාශ කරයි
- ස්වාභාවික ජල ප්‍රභවවලට අපජලය මුදාහැරීමේ බලපෑම විස්තර කරයි.
- ජලය දූෂණය හා එහි බලපෑම් ඉවත් කර ගැනීම සඳහා අපජලය පිරියම් කිරීමේ ක්‍රමවල වැදගත්කම අගය කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:

- ජලයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා ක්ෂුද්‍රජීව විද්‍යාත්මක සංකල්ප හා මූලධර්ම හඳුන්වා දෙන්න.
- පානීය ජලය දූෂණය වන ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.
- ජලය මගින් සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ බුද්ධි කලම්බන සැසියක් මෙහෙයවන්න.
- මලද්‍රව්‍යවලින් දූෂණය වීම හඳුනා ගැනීම සඳහා කෝලිෆෝම් දර්ශකයක් ලෙස යොදාගැනීමේ වැදගත්කම හඳුන්වා දෙන්න. එහි ලාක්ෂණික ලක්ෂණ හඳුන්වා දෙන්න.
- ජලය පිරිපහදු කිරීමේ පිරියතක් පෙන්නුම් කරන වගු උපයෝගි කර ගනිමින්, ජල පිරිපහදු කිරීමේ පියවර විස්තර කරන්න.
- ජල පිරිපහදු ක්‍රියාවලිය සඳහා ගැලීම් සටහනක් ඇඳීමට සිසුන්ට පවරන්න.
- අපජලය පිළිබඳ අර්ථ දැක්වීමක් ගොඩනැංවීමට සිසුන්ට පවරන්න.
- ස්වාභාවික ජල ප්‍රභවවලට අපජලය නිදහස් කිරීමෙන් ඇති වන බලපෑම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අපජලය නිදහස් කිරීමෙන් ඇති වන ජල දූෂණය මගින් ඇති වන බලපෑම් ලැයිස්තුගත කිරීමට පවරන්න.
- අපජලය කළමනාකරණයේ වැදගත්කම අවබෝධ කරවන්න.
- පින්තූර/ වීඩියෝ/ රූපසටහන්/ ක්ෂේත්‍ර චාරිකාවක් ආශ්‍රයෙන් අපජලය පිරිපහදු කිරීමේ පිරියතක පියවර හා එහි මූලධර්ම විස්තර කරන්න.
- කාර්මික ජල පිරිපහදු කිරීමේ පිරියතක ප්‍රධාන පියවර ගැලීම් සටහනක් මගින් දැක්වීමට සිසුන්ට පවරන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- පහත සඳහන් නිර්ණායක උපයෝගි කර ගනිමින් සිසුන්ගේ ගැලීම් සටහන අගයන්න.
  - තොරතුරුවල නිරවද්‍යතාව
  - නිවැරදි අන්තර්-සම්බන්ධතා

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතා මට්ටම 9.4.2 : පාරිසරික සමතුලිතතාව හා සනීපාරක්ෂාව සඳහා ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයේ වැදගත්කම ගවේෂණය කරයි

කාලච්ඡේද : 02 යි

ඉගෙනුම් ඵල :
- ඝන අපද්‍රව්‍යවල ස්වභාවය පැහැදිලි කරයි.
- පාරිසරික හා සනීපාරක්ෂාව සඳහා ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයේ වැදගත්කම පැහැදිලි කරයි.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අදාළ තාක්ෂණික ක්‍රම විස්තර කරයි.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ වැදගත්කම අගය කරයි

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- ''ඝන අප ද්‍රව්‍ය' සඳහා අර්ථ දැක්වීමක් ගොඩනැගීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- ඝන අපද්‍රව්‍ය නිසා අප රට තුළ ඇති වූ විවිධ ඛේදවාචක පිළිබඳ තොරතුරු එකතු කිරීමට සිසුන් යොමු කරන්න. ඉන් පසු ඒ පිළිබඳ වාර්තාවක් සැකසීමට පවසන්න.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ප්‍රතිකර්ම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ වැදගත්කම පිළිබඳ අවබෝධ කරවන්න.
- පහත දැක්වෙන දෑ හඳුන්වා දෙන්න.
  - ප්‍රතිචක්‍රීකරණය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
  - මෙම ක්‍රමවල පාරිසරික හා සනීපාරක්ෂක වැදගත්කම
  - ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ භාවිතවන ක්‍රමවේද

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්
- සිසුන්ගේ වාර්තාව පහත නිර්ණායක යොදා ගනිමින් අගයන්න.
  - තොරතුරුවල නිරවද්‍යතාව
  - අදාළත්වය
  - නියමිත කාලයේදී ඉදිරිපත් කිරීම
  - අලුත් අදහස්

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතාව 9.5. 0 : ආහාර නරක් වීම සඳහා ක්ෂුද්‍රජීවීන්ගේ බලපෑම ගවේෂණය කරයි

නිපුණතා මට්ටම 9.5.1 : දූෂිත ආහාර මගින් වැලඳෙන රෝග නිවාරණය සඳහා දායක වෙයි

කාලච්ඡේද : 06 යි

ඉගෙනුම් ඵල :

- ක්ෂුද්‍රජීවීන් මගින් ආහාර පහසුවෙන් නරක් වන්නේ කෙසේ දැයි ප්‍රකාශ කරයි
- ක්ෂුද්‍රජීව ක්‍රියාවන් මගින් ආහාර නරක් වීමේ දී සිදු වන භෞතික හා රසායනික වෙනස් වීම් පැහැදිලි කරයි
- ආහාර නරක් වීම කෙරෙහි බාහිර හා අභ්‍යන්තර සාධකවල බලපෑම විස්තර කරයි
- මිනිසාට ආහාර ආසාදන ඇති කරන ව්‍යාධිජනකයන් ප්‍රකාශ කරයි.
- ආහාර නරක් වීම මිනිසාගේ සෞඛ්‍යය කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරයි
- ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ක්ෂුද්‍රජීවීන්ගේ බලපෑම පිළිබඳ අගය කරයි

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:

- විවිධ ආහාර රැගෙන ඒමට පවසා , ඒවා නරක් වීම සඳහා තැබීමට සිසුන්ට පවසන්න.
- ඒ නරක් වූ ආහාර නරක්වීම නිරීක්ෂණය කිරීමට උපදෙස් දී, ආහාර නරක් වීම හා එයට හේතු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ආහාර නරක් වීම පිළිබඳ එදිනෙදා අත්දැකීම් මගින් ආහාරයේ නරක් වීම නිසා සිදු වන භෞතික, රසායනික, හා ජෛවීය වෙනස්වීම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ආහාර නරක් වීම උදෙසා බලපාන බාහිර හා අභ්‍යන්තර සාධක හඳුනා ගැනීමට සිසුන්ට සහාය වන්න.
- පහත වගුව සම්පූර්ණ කිරීමට සිසුන් මෙහෙයවන්න

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

| ආහාර වර්ගය | හේතුකාරක ක්ෂුද්‍රජීවීන් | නරක් වූ තත්ත්ව යටතේ ඇති වන වෙනස්වීම් | | |
|---|---|---|---|---|
| | | භෞතික | රසායනික | ජෛවීය |
| 1. බත්/පාන් (කාබෝහයිඩ්‍රේට සහිත ඕනෑම ආහාර)<br>2. මස්<br>3. බටර්<br>4. පළතුරු<br>5. කිරි<br>6. එළවළු | | | | |

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සුදුසු නිර්ණායක යොදා ගනිමින් සිසුන් විසින් සම්පූර්ණ කරන ලද ඉහත වගුව අගයන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## 10 ඒකකය - ව්‍යවහාරික ජීව විද්‍යාව

නිපුණතාව 10.1.0 : ජීවන මට්ටම වැඩිදියුණු කර ගැනීමට ජීව විද්‍යාත්මක සංකල්ප, මූලධර්ම භාවිත කරයි.

නිපුණතා මට්ටම 10.1.1: විසිතුරු මත්ස්‍ය වගා පද්ධති අන්වේෂණය කරයි

කාලච්ඡේද : 05 යි

ඉගෙනුම් ඵල :
- ජලජීව වගාවේ වැදගත්කම හඳුනා ගනියි
- වගා කළ හැකි විශේෂවල සාමාන්‍ය ලක්ෂණ ප්‍රකාශ කරයි.
- විසිතුරු මත්ස්‍ය වගාවේ දී භාවිත වන ජීව විශේෂ ලැයිස්තුවක් සාදයි
- ජලාලයක් පවත්වා ගන්නා ආකාරය විස්තර කරයි.
- විසිතුරු මසුන් අතර ඇති පොදු ලෙඩරෝග ලැයිස්තුගත කරයි.
- විසිතුරු මත්ස්‍ය වගාව මගින් ඇති වන පාරිසරික බලපෑම් පැහැදිලි කරයි
- විසිතුරු මත්ස්‍යයන්ගේ විවිධත්වය අගය කරන අතර ජලාලයක් සැදීමට කැමැත්තක් ඇති කර ගනියි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- ජලජීවි වගාවේ වැදගත්කම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- වගා කළ හැකි ජීවීන්ගේ සාමාන්‍ය ලක්ෂණ ලැයිස්තුගත කිරීමට සිසුන්ට සහාය වන්න.
- විසිතුරු මත්ස්‍ය වගාවේ දී භාවිත කරන විශේෂවල සාමාන්‍ය ලක්ෂණ ලැයිස්තුගත කර, රූප එකතු කරන්න.
- පහත සඳහන් මාතෘකා පිළිබඳ කතාවක් පැවැත්වීමට සිසුන්ට මඟ පෙන්වන්න.
  - ජලාලයක් පවත්වා ගැනීම
  - ජලාලයක හමු වන ප්‍රධාන රෝග
  - විසිතුරු මත්ස්‍ය විවිධත්වය හා ජලාලයකින් අත්කරගත හැකි ප්‍රතිලාභ
  - විසිතුරු මත්ස්‍ය වගාවෙන් ඇති වන පාරිසරික බලපෑම

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- සිසුන්ගේ කථාව පහත නිර්ණායක භාවිතයෙන් අගයන්න.
  - විෂය කරුණුවල නිරවද්‍යතාව
  - ඉදිරිපත් කිරීමේ කුසලතා
  - කාල කළමණාකරණය
  - නව සංකල්ප



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**නිපුණතා මට්ටම 10.1.2 උද්‍යාන භෝග භාවිතයන් ආශ්‍රිත අවස්ථා අන්වේෂණය කරයි.**

**කාලච්ඡේද** : **05 යි**

**ඉගෙනුම් ඵල :**

- පැළ තවාන් ක්‍රමයේ ගැටලු විස්තර කර සාකච්ඡා කරයි
- ආරක්ෂිත කෘෂිකර්ම ක්‍රම සහ තාර්කිකත්වය විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ හරිත ගෘහය තුළ හා පොලිටනල් තුළ වගා කරන ශාක සඳහා උදාහරණ සපයයි.
- පටක වගාවේ මූලධර්ම හා වැදගත්කම විස්තර කරයි
- මල් වගාවේ භාවිත වන ව්‍යාප්ති ක්‍රම හා බද්ධ ක්‍රම විස්තර කරයි.
- ශ්‍රී ලංකාව තුළ භාවිත වන මල් වගා ක්‍රම උදාහරණ සහිතව සඳහන් කරයි.
- කෘෂිකර්මාන්තයේ දී උද්‍යාන භෝග වගාවේ වැදගත්කම හා භාවිතය අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

- උද්‍යාන භෝග භාවිතය හඳුන්වා දෙන්න.
- පැල තවාන් කළමනාකරණය සඳහා අර්ථ දැක්වීමක් ගොඩනැංවීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- පැල තවාන් කළමනාකරණයේ ගැටලු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ආරක්ෂිත කෘෂිකර්ම සංකල්පය සාකච්ඡා කරන්න.
- පහත සඳහන් දෑ පිළිබඳ ඉදිරිපත් කිරීමක් කිරීමට සිසු කණ්ඩායම්වලට මග පෙන්වන්න.
    - ආරක්ෂිත කෘෂිකර්මාන්තය
    - පටක රෝපණය
    - මල් වගාව- (ශ්‍රී ලංකාවේ වගා කරන උදාහරණවලට අදාළව)
- ආරක්ෂිත කෘෂිකර්මාන්ත ක්‍රම හා තාර්කිකත්වය පැහැදිලි කරන්න.
- ඉහත සඳහන් දෑ භාවිත වන කෘෂිකාර්මික පර්යේෂණ ස්ථානයකට හෝ උද්භිද උද්‍යානයකට ක්ෂේත්‍ර චාරිකාවක් සූදානම් කරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් පහත නිර්ණායක යොදා ගනිමින් අගයන්න.
    - විෂය කරුණුවල නිරවද්‍යතාව
    - විෂය කරුණුවල අදාළත්වය
    - කාර්යයේ නිමාව



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතා මට්ටම 10.1.3 වාහක මඟින් පැතිරෙන රෝග අවබෝධ කර ගැනීම හා ඒ රෝග අවම කර ගැනීමට ජීව විද්‍යා දැනුම භාවිත කරයි

කාලච්ඡේද : 05 යි

ඉගෙනුම් ඵල :
- ඩෙංගු, බරවා රෝග සම්ප්‍රේෂණය වන ක්‍රම විස්තර කරයි.
- ආසාදනවල රෝග ලක්ෂණ විස්තර කරයි.
- වාහකයන් පාලනය කිරීම හා ඒ ආශ්‍රිත ගැටලු විස්තර කරයි.
- වාහක මඟින් පැතිරෙන රෝග නිවාරණය කිරීම සඳහා පරිසරය පිරිසිදුව තබා ගැනීමේ වැදගත්කම අගය කරයි

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:
- වාහක මගින් සම්ප්‍රේෂණය වන රෝග හඳුන්වා දෙන්න.
- වෛද්‍ය මධ්‍යස්ථාන මගින් ප්‍රකාශයට පත් කරන ලද ඩෙංගු/ බරවා රෝග සම්බන්ධ ලිපි/ අත්පත්‍රිකා/පෝස්ටර් එකතු කිරීමට සිසුන්ට පවරන්න.
- එකතු කරන ලද ද්‍රව්‍ය ආධාරයෙන් පහත වගුව සම්පූර්ණ කිරීමට සිසුන්ට මග පෙන්වන්න.

| | ඩෙංගු | බරවා |
|---|---|---|
| • වාහකයාගේ නම | | |
| • වාහකයාගේ සාමාන්‍ය ලක්ෂණ | | |
| • හේතුකාරකයා | | |
| • බෝ වන ස්ථාන | | |
| • රෝගයේ සාමාන්‍ය ලක්ෂණ | | |
| • පාලනය කරන ආකාරය | | |

- ඉහත වගුව පිළිබඳ සාකච්ඡා කරන්න

www.alevelapi.com

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්
- සුදුසු නිර්ණායක භාවිත කර ඉහත වගුව අගයන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතා මට්ටම 10.1.4 ආහාර කල් තබා ගැනීම සහ පශ්චාත් අස්වනු හානිය පිළිබඳ දැනුම සාර්ථක ලෙස එදිනෙදා ජීවිතයට භාවිත කරයි.

කාලච්ඡේද : 05 යි

ඉගෙනුම් ඵල :

- ආහාර පරිරක්ෂණයේ වැදගත්කම විස්තර කරයි.
- ආහාර පරිරක්ෂණයේ දී යොදා ගන්නා මූලධර්ම තුන ප්‍රකාශ කරයි
- විවිධ ආහාර පරිරක්ෂණ ක්‍රම ප්‍රකාශ කරයි. උදාහරණ ලෙස වියළීම, ලුණු දැමීම, ලුණු දමා වියළීම, සීනි දැමීම, පැස්ටරීකරණය, දුම් ගැසීම, රසායනික ද්‍රව්‍ය එකතු කිරීම, විකිරණ හා උෂ්ණත්වය
- පශ්චාත් අස්වනු හායනයට හේතු සාකච්ඡා කරයි.
- පශ්චාත් අස්වනු හායනය අස්වනු නෙළීමේ දී, පරිවහනයේ දී, ගබඩා කිරීමේ දී හා ගෘහස්ථ ආහාර සැකසීමේ දී අවම කර ගන්නා ආකාරය පැහැදිලි කරයි.
- ආහාර පරිරක්ෂණ ක්‍රමවල වැදගත්කම අගය කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:

- ආහාර පරිරක්ෂණයේ අවශ්‍යතාව හා වැදගත්කම සාකච්ඡා කරන්න.
- ආහාර පරිරක්ෂණයේ මූලධර්ම සාකච්ඡා කරන්න.
- විවිධ ආහාර වර්ග හා ආහාරවල ලේබල් හා ඇසුරුම් පන්ති කාමරයට ගෙන ඒමට සිසුන්ට පවසන්න.
- ගෙන එන ලද ද්‍රව්‍ය උපයෝගි කර ගනිමින් පහත වගුව සම්පූර්ණ කිරීමට සිසුන්ට පවරන්න.

| ආහාර පරිරක්ෂණ ආකාර | ආහාර පරිරක්ෂණ මූලධර්ම | උදාහරණ |
|---|---|---|
| | | |

- පසු අස්වනු හානියට හේතු ලැයිස්තුගත කිරීමට සිසුන් යොමු කරන්න.
- පසු අස්වනු හානිය සිදු වන ස්ථාන පිළිබඳ සෙවීමට සිසුන් යොමු කරන්න.
- පරිවහනයේ දී, ගබඩා කිරීමේ දී හා ගෘහස්ථ ආහාර සැකසීමේ දී පසු අස්වනු හානිය අවම කර ගන්නා ආකාරය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- සිසුන් විසින් සම්පූර්ණ කරන ලද වගුව සුදුසු නිර්ණායක උපයෝගී කර ගනිමින් අගයන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නිපුණතා මට්ටම 10.1.5 ජීව විද්‍යාව සම්බන්ධ නව්‍ය තාක්ෂණ වල භාවිත පිළිබඳ යෙදීම් යාවත්කාලීන කර ගනියි.

කාලච්ඡේද : 05 යි

ඉගෙනුම් ඵල :

- නැනෝ තාක්ෂණය යනු කුමක් දැයි විස්තර කරයි.
- ජීව විද්‍යාවේ දී නැනෝ තාක්ෂණයේ යෙදීම් ප්‍රකාශ කරයි.
- මූලික සෛල යනු මොනවා දැයි නම් කොට, ඒවායේ ප්‍රභව ලැයිස්තුගත කරයි.
- වෛද්‍ය විද්‍යාවේ දී මූලික සෛලවල භාවිතා ප්‍රකාශ කර, ඒ ආශ්‍රිත ගැටලු සාකච්ඡා කරයි.
- මානව ජෙනෝම ව්‍යාපෘතියේ භාවිත සහ එහි ප්‍රතිඵල විස්තාරණය කරයි
- ප්‍රතිකාර කළ නොහැකි මානව රෝගාබාධ සඳහා මූලික සෛල ප්‍රතිකර්මවල වැදගත්කම අගය කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස්:

- තාක්ෂණයේ දියුණුව පිළිබඳ සෙවීමට සිසුන්ට පවසන්න. ඉන් පසු ජීව විද්‍යාවේ නූතන තාක්ෂණයේ යෙදීම් පිළිබඳ අවධානය යොමු කිරීමට පවසන්න.
- නැනෝ තාක්ෂණය යනු කුමක් දැයි සාකච්ඡා කරන්න. ජීව විද්‍යාවේ දී නැනෝ තාක්ෂණයේ යොදා ගැනීම් පිළිබඳ සෙවීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- මූලික සෛල ප්‍රතිකර්ම පිළිබඳ කෙටි හැඳින්වීමක් ලබා දෙන්න.
- සිසු කණ්ඩායම් මූලික සෛල ප්‍රතිකර්මවල යෙදීම් සහ ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳ සෙවීමටත් ඒවා ඉදිරිපත් කිරීමටත් යොමු කරන්න.
- මානව ජෙනෝම ව්‍යාපෘතිය හා අනෙකුත් ජෙනෝම පිළිබඳ සාකච්ඡා කරන්න.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් පහත සඳහන් නිර්ණායක යොදා ගනිමින් අගයන්න.
  - තොරතුරුවල නිරවද්‍යතාව
  - තොරතුරුවල අදාළත්වය
  - ඉදිරිපත් කිරීමේ කුසලතාව

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .